# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2221/54 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකයඃ පීඑස්/සීඑස්ඒ/00/1/14/28

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු බේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, 1978 අංක 04 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 07 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1A - G 33905 — 385 (2021/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1. ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු බේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. ගරු ආර්.එම්. සෝභිත රාජකරුණා මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර

මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා, එනම්,

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි ලබා දී ඇති දිවුරුම කඩ කරමින් එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කිරීම,

II. බලය අනිසි ලෙස පරිහරණය කිරීම හෝ බලය අයථා පරිදි පාවිච්චි කිරීම, මැදිහත් වීම, වංචා කිරීම, දූෂණය, සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම හෝ ඥාති සංග්‍රහය

III. යම් තැනැත්තෙකුගෙන් දේශපාලන වශයෙන් පලි ගැනීම,

IV. යම් තැනැත්තෙකුගේ -

(අ) යම් පත්වීමක් ලබා දීමේදී හෝ ස්ථාන මාරුවක් සිදු කිරීමේදී,
(ආ) යම් උසස් වීමක් දීමේදී,
(ඇ) යම් අක්‍රමිකතාවක් හේතුවෙන් සේවය අවසන් කිරීමේදී,
යම් අක්‍රමිකතාවයක්
(ඇ) යම් ලිඛිත නීතියක් උල්ලංඝනය කිරීම,

සිදු කර තිබේද යන වග හා 2021.01.29 වැනි දිනැති අංක : 2212/53 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි සඳහන් කෙරුණු පරිදි වන වගඋත්තරකරුවන් එසේ වගකිවයුතු වන්නේ කෙතරම් දුරකටද යන වග තව දුරටත් විමර්ශනය කර වාර්තා කිරීම පිණිස ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වැනි අනු ව්‍යවස්ථාව සහ 1978 අංක 04 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 07 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 09 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් තැනැත්තෙකු ප්‍රජා අශක්නුතාවකට යටත් කළ යුතු ද යන වග නිර්දේශ කිරීම පිණිස ද මාගේ කොමසාරිස්වරයන් වශයෙන් මෙයින් පත් කරමි.

තවද, 2021 ජනවාරි 28 වන දින මා විසින් කරන ලද එම නියෝගය 2021 ජනවාරි 29 වන සිකුරාදා දින අංක 2212/53 දරන රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද හෙයින් ද,

තවද, (393 වන අධිකාරය වන) සංශෝධිත ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වන වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිල මුද්‍රාව යටතේ 2020 ජනවාරි මස 09 වන දින නිකුත් කරන ලද අධිකාර පත්‍රය මඟින් මවිසින් ස්ථාපිත ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් මවෙත ඉදිරිපත් කරනු ලැබූ එකී වාර්තාවෙහි හඳුනාගනු ලැබූ නිශ්චිත තැනැත්තන්ට එරෙහිව සහ/හෝ ඔවුන් සම්බන්ධයෙන් කරනු ලැබූ නිශ්චිත නිගමනයන්, තීරණයන් සහ නිර්දේශ ගණනාවක් සලකා බලන ලදුව එකී වාර්තාවෙහි ඇතුළත් එබඳු නිශ්චිත නිගමනයන්, තීරණයන් සහ නිර්දේශයන්, මහජන සුබ සිද්ධිය තකා සහ වඩා පරීක්ෂාවට භාජනය කිරීමේ කාර්යයන් සඳහා ඔබ විසින් තව දුරටත් පරීක්ෂාවට ලක් කොට එකී වාර්තාවෙහි ඇතුළත් එකී නිගමනයන්, තීරණයන් සහ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම මෙන්ම ඊට අදාළව යම් ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා යෝග්‍යතාවක් සහ සාධාරණීකරණයක් ඇතොත් මවෙත වාර්තා කළ යුතු යන්න මගේ නිශ්චිත මතය වන හෙයින් ද,

තව ද, එකී නිශ්චිත කාර්යය සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 (1) වගන්තිය සමඟ කියවිය යුතු 5 වන වගන්තිය ප්‍රකාර, ඔබ වෙත නිකුත් කර ඇති මුල් නිර්ණය කරුණු, එකී නිර්ණය කරුණු වල අංක 2 ලෙස මතු දැක්වෙන අයිතමය අමතරව ඇතුළත් වන පරිදි සංශෝධනයක් මඟින් පුළුල් කළ යුතුය යන්න මගේ මතය වන හෙයින් ද,

2. 2021 ජනවාරි මස 29 දින පළ කරන ලද අංක 2212/53 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි ඇතුළත් පරිදි ඔබ වෙත නිකුත් කෙරුණු නිර්ණය කරුණු වල අංක 1 ප්‍රකාර ඔබ විසින් එයට අතිරේකව පරීක්ෂා කොට වාර්තා කළ යුතු කරුණුවල විශේෂයෙන් නිශ්චිතභාවයට අගතියකින් තොරව සහ එකී හඳුනාගනු ලැබූ තැනැත්තන් සියල්ලම හෝ යම් කිසිවකුට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි කෙරුණු නිගමනයන්, තීරණයන්, නිර්දේශයන් සියල්ලම හෝ කිසිවක් යුක්ති සහගත වන්නේ ද යන්න සහ ඒවා කිසිවක් හෝ සියල්ලම ක්‍රියාත්මක කළ යුතු ද, නැතහොත් ක්‍රියාත්මක කරලීමට සැලැස්විය යුතු ද, එසේ නැතහොත් අන්‍යාකාරයකින් තව දුරටත් කටයුතු කරගෙන යා යුතු ද යන්න පරීක්ෂා කොට වාර්තා කිරීම සහ ඔබගේ අභිමතය පරිදි මෙම සංශෝධිත

නිර්ණේය විෂයයන්ගෙන් පැන නගින සහ එකී නිර්ණේය විෂයයන්ට ඇතුළත් කිසියම් කරුණක් පිළිබඳව යම් සීමිත හෝ සාමාන්‍ය විමර්ශනයක් හෝ තව දුරටත් විමර්ශනයක් කිරීම අවශ්‍ය යැයි ඔබේ අභිමතය අනුව පෙනී යන්නේ නම් හෝ එසේ නැතහොත් යෝග්‍ය යැයි ඔබට පෙනී යා හැකි පරිදි ඔබේ පරීක්ෂණය පොදුවේ ඉහත කී වාර්තාවේ අන්තර්ගතය විස්තරාත්මකව සලකා බැලීමකට සහ පූර්ණ පරීක්ෂාවකට සීමා කරලීම.

ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉහත සඳහන් අතිරේක කොන්දේසි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය විය හැකි එවැනි සියලු පියවර ගන්නා ලෙස මම මෙයින් ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසි එකක් වූ අප්‍රේල් මස 01 වන දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.